# කොළඹ දිසා අධිකරණයේදීය.

කොළඹ ලෝටස් පාරේ, අංක 55,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්ණය බාරේ,
හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්
සමාගම පිළිබඳව වන කාරණය
සම්බන්ධයෙනි.

නඩු අංකය: 217/සීඕ

සහ

1982 අංක 18 දරණ සමාගම් පනතේ ix
කොටස යටතේ අධිකරණය විසින් ඇවර
කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක්
පිළිබඳව වන කාරණය සම්බන්ධයෙනි.

නිහාල් ශ්‍රී අමරසේකර, අංක 167/4,
විපුලසේන මාවත, කොළඹ 10.
<u>පෙත්සම්කරු</u>.

2006 දෙසැම්බර් මස 07 වන දිනැති මෝසමට අමතරව මෙම නඩුවෙන් ඇවර කිරීමට යෝජිත සමාගම ඇවර කිරීමට විරෝධය පාමින් දෙන ලද දිව්රුම් ප්‍රකාශය අපි මේ සමඟ ඉදිරිපත් කරන අතර, ගරු අධිකරණය විසින් එය භාර ගන්නා ලෙස අයැද සිටිමු.

2006 ක්වූ දෙසැම්බර් මස 08 වන දිනදීය.

Sgd. D. L. & F. DE SARAM

ඇවර කිරීමට යෝජිත සමාගම වෙනුවෙන් වූ නීතිඥවරු.

මෙහි පිටපතක් පෙත්සම්කරුගේ නීතිඥවරු )
වෙත යවා අදාල ලදුපත මීට අමුණා ඇත. )

# <u>කොළඹ දිසා අධිකරණයේදීය.</u>

කොළඹ ලෝටස් පාරේ, අංක 55,
කොළඹ හිල්ටන් ක්‍රීඩා සංකීර්නය බාරේ,
හොටේල් ඩෙවලපර්ස් (ලංකා) ලිමිටඩ්
සමාගම පිළිබඳව වන කාරණය
සම්බන්ධයෙනි.

නඩු අංකය: 217/සිම්

සහ

1982 අංක 18 දරණ සමාගම් පනතේ ix
කොටස යටතේ අධිකරණය විසින් ඇවර
කිරීම සඳහා කරනු ලබන ඉල්ලීමක්
පිළිබඳව වන කාරණය සම්බන්ධයෙනි.

නිහාල් ශ්‍රී අමරසේකර, අංක 167/4,
විපුලසේන මාවත, කොළඹ 10.
<u>පෙත්සම්කරු</u>.

කොළඹ 07, හෝර්ටන් ගාඩින්ස් , අංක 100/11 හි මොහොමඩ් නවාස් රාජාබ්දීන් වන මම ඉස්ලාම් භක්තිකයෙකු වශයෙන් ගාම්භිරතා පූර්වකව, අවංකව සහ සත්‍ය ලෙස ද පහත සදහන් පරිදි ප්‍රකාශ කර ප්‍රතිඥා දී සිටිමි.

1 මම, මෙහි නිශ්චිතවම පිළිගනු ලබන සම්ප්‍රකාශයන් වෙතොත් ඒවා හැර පෙත්සම්කරුගේ පෙත්සමේ අඩංගු සම්ප්‍රකාශයන් කිහිපය එක්ව හා වෙන් වෙන්ව අපලාපනය කරමි.

2 මම පෙත්සමේ 1, 2, 3(අ), 4(අ) සහ 5වන ජේදවල අඩංගු සම්ප්‍රකාශයන් පිළිගනිමි.

3 සමාගමේ නිකුත් කල ප්‍රාග්ධනය රු.452,261,410/=ක් බව මම පිළි ගනිමි. එකී පිළි ගැනිමට යටත්ව 3(ආ) සහ 4(ආ) ජේදවල අඩංගු අනෙකුත් සම්ප්‍රකාශයන් මම අපලාපනය කර සිටිමි.

4 පෙත්සමේ 6-10 දක්වා වූ ජේදවල සදහන් වී ඇති නඩු කිහිපය වෙතොත් ඒවා හැර පෙත්සමේ එකී 6, 7, 8, 9 හා 10 වන ජේදවල අඩංගු වී ඇති කරුණු සම්බන්ධයෙන් මම නොදන්නා බැවින් එනිසාම එකී සම්ප්‍රකාශයන් අපලාපනය කර සිටිමි.

5 මම, පෙත්සමේ 11 හා 12 වන ජේදවල අඩංගු කරුණු අපලාපනය කර සිටින අතර, ඒවා තරයේ ඔප්පු කරන ලෙස පෙත්සම්කරුට අභියෝග කර සිටිමි.

6 කෙසේ වෙතත් පෙත්සමේ 13, 14, 15 හා 16 වන ඡේදවල අඩංගු කරුණුවලින් ස්වල්පයක් ඇත්ත වශයෙන්ම නිවැරදි බවත්, එම කරුණු පෙත්සම්කරු විසින් සකස් කර හෝ නියෝජනය කර ඇති ආකාරය නිසා අධිකරණය සම්පූර්ණයෙන් නොමග යැවීම පිණිස හා හිතාමතාම අධිකරණයට කරුණු අවනිදේශනය කිරීමක් කර ඇත. එනිසාම එකී ඡේදවල අඩංගු සම්ප්‍රකාශයන් මම අනිවාර්යයෙන්ම අපලාපනය කර සිටින අතර, ඒවා තරයේ ඔප්පු කරන ලෙස පෙත්සම්කරුට අභියෝග කර සිටිමි.

7 මම, පෙත්සමේ 16 වන ඡේදයේ සම්ප්‍රකාශයන් නිශ්චිතවම අපලාපනය කර සිටිමින් ඒවා තරයේ ඔප්පු කරන ලෙස පෙත්සම්කරුට අභියෝග කර සිටිමි.

8 මම පෙත්සමේ 17, 18, 19 හා 20 වන ඡේදවල අඩංගු සම්ප්‍රකාශයන් අපලාපනය කරමි. තව ද, මෙහි පහත දක්වා ඇති කරුණු හේතුවෙන් සමාගම විසින් රජයට පැහැර හැරීම් කර තිබෙන බව කියවෙන සම්ප්‍රකාශයන් මම නිශ්චිතවම අපලාපනය කර සිටිමි.

9 පී14 ලකුණු කර පෙත්සමට අමුණා ඇති ලියවිල්ල මම පිලි ගනිමි. එකී පිලි ගැනිමට යටත්ව පෙත්සමේ 21 වන ඡේදයේ අඩංගු අනෙකුත් සම්ප්‍රකාශයන් මම අපලාපනය කරමි.

10 මම පෙත්සමේ 22 හා 23 වන ඡේදවල අඩංගු සම්ප්‍රකාශයන් අපලාපනය කරමි.

11 මම, පෙත්සමේ 24 වන ඡේදයේ අඩංගු සම්ප්‍රකාශයේ කරුණු නිශ්චිතවම අපලාපනය කර සිටින අතර, ඒවා තරයේ ඔප්පු කරන ලෙස පෙත්සම්කරුට අභියෝග කර සිටිමි.

12 ඉහත කී සම්ප්‍රකාශයන්ට යටත්ව හා ඊට අගතියෙන් තොරව මම පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටිමි.

13 පෙත්සම්කරුට නීතියෙහිලා මෙම අයදුම්පත පවරා පවත්වාගෙන යාමට තත්වයක් හෝ නෛතික තත්වයක් (Locus standi) නොමැති බවට ප්‍රකාශ කරන ලෙස මා හට උපදෙස් දී ඇත.

14 කෙසේ වෙතත් පෙත්සමේ අඩංගු සම්ප්‍රකාශයන්ට අයැද ඇති සහනයන් අධිකරණය විසින් පෙත්සම්කරුට ප්‍රදානය නොකරනු ලබන බවට ප්‍රකාශ කරන ලෙස මා හට උපදෙස් දී ඇත.

15 පෙත්සම්කරු, නීතියෙහිලා අනුගම්‍ය විධිවිධාන අනුගමනය කර නොමැති බව මම ප්‍රකාශ කර සිටින අතර, එසේ ප්‍රකාශ කරන ලෙස මා හට උපදෙස් දී ඇත.

16 ඇවර කිරීම පිණිස වූ අයදුම්පත වක් සිතින් ඉදිරිපත් කර ඇති බව මම ප්‍රකාශ කර සිටිමි.

17 කෙසේ වෙතත් ඉහත සඳහන් සම්ප්‍රකාශයන්ට අගතියෙන් තොරව පෙත්සම්කරුට විකල්ප ප්‍රතිකර්ම තිබෙන බව ප්‍රකාශ කරන ලෙස මා හට උපදෙස් දී ඇත.

18 මෙම අයදුම්පත පිලිබඳව අහිතකර ලෙස ප්‍රසිද්ධ කිරීම හේතුවෙන් සමාගමට අලාභ හා හානි සිදු වී ඇති අතර, පෙත්සම්කරුගෙන් ඒවා හිමිකම් පෑමට සමාගමට ඇති අයිතිය සමාගම වෙන් කර තබා ගන්නා බව මම ප්‍රකාශ කර සිටිමි.

19 රජය හෝ ජපන් ණය හිමියන් විසින් ඔවුන් වෙත අයවිය යුතු මුදල් වහාම ගෙවන ලෙස ඉල්ලා නොමැති හෙයින් දැනට ශ්‍රී ලංකා රජයට හෝ ජපන් ණය හිමියන්ට කිසිම මුදලක් ගෙවීමට අවශ්‍ය නොවන බව මම ප්‍රකාශ කර සිටිමි.

20 සමාගමේ කොටස් දැරීම් දළ වශයෙන් පහත සඳහන් පරිදි බව මම ප්‍රකාශ කරමි.

| | | |
|---|---|---|
| I | මහාභාණ්ඩාගාරයේ ලේකම් | 65% |
| II | ජපන් ණය හිමියන් | 27.5% |
| III | මහජන කොටස්හිමියන් | 7.5% |

21 සමාගම ඈවර කිරීම සඳහා වූ අයදුම්පතට මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ ජපන් ණයහිමියන් විරුද්ධ වන බව මම සැබවින්ම විශ්වාස කරමි. මහජන කොටස් දරන්නන් කිහිප දෙනෙකු විසින් ද ඈවර කිරීමේ අයදුම්පතට විරුද්ධ වන බව මම සැබවින්ම විශ්වාස කරමි.

22 සමාගමේ එකම ව්‍යාපාරය වනුයේ දැන් හිල්ටන් කලම්බු යනුවෙන් හඳුන්වනු ලබන හෝටලය පවත්වාගෙන යාම බව මම ප්‍රකාශ කරමි. මෙහි මින්මතු සඳහන් වන පරිදි හිල්ටන් කලම්බු හෝටලය ක්‍රියාකාරී ලාභයක් පෙන්නුම් කර ඇති බව මම ප්‍රකාශ කරමි.

හිල්ටන් කලම්බු හි 1998-2006 දක්වා වූ වර්ෂ සඳහා වන දළ ක්‍රියාකාරී ලාභය අයිතිකරුවන්ගේ වාර්තාව සහ පොලියට ප්‍රථම ශුද්ධ ලාභය පෙන්නුම් කරන ලියවිලි "**එක්ස්**" ලකුණු කර මේ සමඟ ඉදිරිපත් කර ඒවා මෙම දිව්රුම් ප්‍රකාශයේම කොටසක් ලෙස අයැද සිටිමි.

23 එකී හෝටලය ක්‍රියාත්මක තත්වයේ තිබෙන අතර, ශ්‍රී ලංකාවේ තිබෙන ඉතා හොඳ තරු පහේ හෝටල්වලින් එකක් බවට තීරණය කර ඇති බව මම තවදුරටත් ප්‍රකාශ කරමි.

24 පෙත්සමට අමුණා ඉදිරිපත් කර ඇති ලාභාලාභ ගිණුමේ පෙන්වා ඇති පාඩු මිට්සුයි ඇන්ඩ් ටයිසෙ, ශ්‍රී ලංකා රජයෙන් හා ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද ණය මුදල්වලට ගෙවූ පොලී සඳහා වන බව මම ප්‍රකාශ කරමි.

25 පෙත්සම්කරු 1983 මාර්තු මාසයේ සිට 1990 දෙසැම්බර් මාසය දක්වා සහ 1994 ඔක්තෝම්බර් මාසයේ සිට 2005 නොවැම්බර් මාසය දක්වා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකුව සිටි බවත්, ඉන්පසු 2004 ජූලි මාසයේ සිට 2005 නොවැම්බර් මාසය දක්වා සමාගමේ සභාපති ලෙස සිටි බවත් මම ප්‍රකාශ කරමි.

26 පෙත්සමේ මතුපිටින් මම ප්‍රකාශ කර සිටින්නේ කෙසේ වෙතත් සමාගම ඈවර කිරීමෙන් කොටස් දරන්නන්ට සහ/හෝ ණයහිමියන්ට කිසිම ප්‍රතිලාභයක් අත් නොවන බවයි.

27 සමාගම ඈවර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇත්ත වශයෙන්ම පොදුවේ ශ්‍රී ලංකාවට මෙන්ම සමාගමේ සේවය කරනු ලබන දළ වශයෙන් 850ක් වන සේවකයන්ගේ රැකියා අහිමි වීමෙන් අසාධාරණයක් වන අතර, විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරයට අහිතකර ලෙස බලපානු ඇත.

28 සමාගමේ කොටස් දරන්නන්ගේ සහ ණය හිමියන්ගේ යහපත පිණිස මෙම ව්‍යාපාරය දිගටම කරගෙන යාම සහ/හෝ සමාගම ඈවර නොකිරීම සමාගමේ යහපත පිණිස වන බව මම ප්‍රකාශ කරමි.

29 පෙත්සම්කරුගේ කොටස් මිලදී ගැනීමට ගැණුම්කරුවන් කැමැත්තෙන් සිටින බව මම සැබවින්ම විශ්වාස කරමි.

30 මෙම දිව්රුම් ප්‍රකාශය සකස් කරන ලද්දේ මම මගේ පුද්ගලික දැනීමෙන් හා මා වෙත ලබා දෙන ලද ලියකියවිලි කියවා බැලීමෙන් පසු බව මම ප්‍රකාශ කර කර සිටින අතර සමාගම වෙනුවෙන් තවදුරටත් දිව්රුම් ප්‍රකාශයක් ගොනු කිරීමේ අයිතිය මම ගෞරවපූර්වකව රඳවා තබා ගනිමි.

31 1995 ජූනි 28 වන දිනැති සමථයකට පත් කිරීමේ ගිවිසුම්වල සත්‍ය පිටපත් <u>**එක්ස්1-එක්ස්3**</u> දක්වා ලකුණු කර මෙම දිව්රුම් ප්‍රකාශයට අමුණා මම මේ සමඟ ඉදිරිපත් කර සිටින අතර, ඒවා මෙම දිව්රුම් ප්‍රකාශයේම කොටසක් ලෙස ගෞරවපූර්වකව අයැද සිටිමි.

ඉහත නම් සඳහන් ප්‍රතිඥා දී සිටින්නාට )
කියවා පැහැදිලි කර දී අවබෝධ කර )
2006 ක්වූ දෙසැම්බර් මස 08 වන මෙදින )
කොළඹදී ප්‍රතිඥා දී අත්සන් කරන ලදී )

මා ඉදිරිපිටදීය.

HPMMendis

සාම විනිසුරු/දිව්රුම් කොමසාරිස්